**ශීර්ෂය - 229 නීතිපති දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 229 - නීතිපති දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්,ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව නීතිපතිවරයා වෙත 2016 සැප්තැම්බර් 22 දින නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම වේ. වංචා හෝ වැරදි හේතුවෙන්ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරිම, ක්‍රියාත්මක කිරිම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 2. ගිණුම්

---

### 2.1 විසර්ජන ගිණුම

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,268.12 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 746.22 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 521.90 ක් හෙවත් සියයට 41.16 ක ප්‍රතිපාදන ඉතිරි වි තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 657.62 | 655.07 | 2.55 | 0.39 |
| මූලධන | 610.50 | 91.15 | 519.35 | 85.07 |
| **එකතුව** | **1,268.12** | **746.22** | **521.90** | **41.16** |

## 2.2 ආදායම් ගිණුම

### ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම

දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂය සඳහා ආදායම් සංකේතයක් සඳහා රු.මිලියන 35.30 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 32.59 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 92.32 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2015 දෙසැම්බර් 31දිනට | | | ඌනතාවය ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඌනතාවය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 20.03.02.11 | 35.30 | 32.59 | 2.71 | 7.68 |

## 2.3 අත්තිකාරම් ගිණුම

### රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

### පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 22901 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 23.00 | 15.66 | 11.50 | 15.27 | 80.00 | 41.99 |

## 2.4 අග්‍රිම ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7002/0000/00/0137/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 11.13 ක් විය.

## 2.5 පොදු තැන්පත් ගිණුම්

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් අංක 6000/0000/00/0018/0047/000 හි 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 1.64 ක් විය.

## 2.6 විගණන නිරීක්ෂණය

නීතිපති දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන යාවත්කාලීන කර පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| පාඩු හා හානි ලේඛනය | මුදල් රෙගුලාසි 110 |

### 3.2 ආදායම් ගිණුම

ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් අංක 20.03.02.11 දරන සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවලින් නෛතික ගාස්තු ආදායම් සංකේතයට අදාළ ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස්කිරීම, ගිණුම්ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරයන් පැවරී තිබුණි. එම ආදායම් සංකේතයට අදාළව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ඉකුත් වර්ෂයේ තථ්‍ය ආදායම වඩා සමාලෝචිත වර්ෂයේ තථ්‍ය ආදායම අඩුවීම රු.මිලියන 3.5 ක්වී තිබුණි. විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව හිඟහිටි ආදායම රු.148,012,188 ක් ලෙස දක්වා තිබුණද, විගණනයේදී අනාවරණය කර ගත් කරුණු අනුව එය රු.195,676,745 ක් පමණ වී තිබුණි. ඒ අනුව ගිණුම්ගත නොවූ හිඟ ආදායම රු.47,664,557 ක් වී තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි )(2)128ඉ (ප්‍රකාරව රාජ්‍ය ආදායම ගණන්දීමේ නිලධාරීන් විසින් රජයට ලැබිය යුතුව තිබෙන හිඟ ආදායම් අප්‍රමාදව අයකර ගැනීම සම්බන්ධව විශේෂ විධිවිධාන යෙදවිය යුතු වුවද, 31 දෙසැම්බර් 2015 දින වන විට හිඟ ආදායම රු195.,676,74ක් වූ අතර වර්ෂ 5 අනුව කාල විශ්ලේෂණය පහත දැක්වේ .

| ආදායම් හිඟහිටි කාල පරාසය | හිඟ ආදායම් |
|---|---|
| | රු. |
| වර්ෂ 1 කට අඩු | 25,868,150 |
| වර්ෂ 1 කට වැඩි වර්ෂ 3 කට අඩු | 85,990,918 |
| වර්ෂ 3 කට වැඩි වර්ෂ 6 කට අඩු | 47,682,512 |
| වර්ෂ 6 කට වැඩි වර්ෂ 9 කට අඩු | 28,853,775 |
| වර්ෂ 9 කට වැඩි | 7,281,390 |
| **එකතුව** | **195,676,745** |

(ඇ) වර්ෂ 1ට වැඩි කාලයක සිට පැවැත එන හිඟහිටි ආදායම රු.169,808,595 ක් වූ අතර, එම හිඟහිටි ආදායම අදාළ ආයතන ගණන සමඟ සසඳා කාල විශ්ලේෂණය පහත දැක්වේ.

| හිඟහිටි ආදායම් පරාසය | ආයතන සංඛ්‍යාව | හිඟහිටි ආදායම |
|---|---|---|
| රු.ලක්ෂ | | රු. |
| 5 කට අඩු | 124 | 12,862,084 |
| 5 ක වැඩි 10 කට අඩු | 18 | 11,933,258 |
| 10 කට වැඩි 50 කට අඩු | 11 | 27,252,753 |
| 50 කට වැඩි 100 කට අඩු | 05 | 36,556,860 |
| 100 කට වැඩි | 03 | 81,203,640 |
| **එකතුව** | | **169,808,595** |

## 3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

විෂය අංක 22901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.2,372,217 ක් වූ අතර, 2016 සැප්තැම්බර් 13 දින වන විට එම හිඟහිටි ශේෂ වර්ෂ 1 ක සිට වර්ෂ 20 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම ශේෂ 2016 සැප්තැම්බර් 13 දින වන විටත් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 13.6 වගන්තිය ප්‍රකාරව රජයේ නිලධාරියෙකු හට වර්ෂයකට එක් වරක් පමණක් උත්සව අත්තිකාරම් ගෙවිය හැකි වුවත්, ඊට පටහැනිව දෙපාර්තමේන්තුව විසින් නිලධාරීන් විසින් උත්සව අත්තිකාරම් ලබා ගෙන වර්ෂයක් ගතවීමට ප්‍රථම නැවත උත්සව අත්තිකාරම් ගෙවා තිබුණු අවස්ථාවන් නිරික්ෂණය විය.

## 3.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිලියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

### 3.4.2 අභ්‍යන්තර විගණනය

දෙපාර්තමේන්තුවේ 2015 වර්ෂයේදි ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,268 ක් හා අනුමත සේවක සංඛ්‍යාව 866 ක් වී තිබූ අතර 2015 දෙසැම්බර් 31 මුළු වත්කම්වල වටිනාකම රු.මිලියන727 ක් වී තිබුණි. මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව 2015 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් දෙපාර්තමේන්තුවේ සිදු කර නොතිබුණි.

## 3.5 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2016 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් එම වාර්තා 2016 ජුනි 27 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි.

(ආ) 2015 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලට අනුව අංශ 125 කින් අංශ 50 ක නියැදි පරීක්ෂණ යක් සිදු කරන ලදී. ඒ අනුව අතිරික්තතා සහ ඌනතා විශාල ප්‍රමාණයක් නිරීක්ෂණය විය. පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා කරන ලද වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි 2016 ජුනි 27 දින වන විටත් කටයුතු කර නොතිබුණි**.**

(ඇ) නීතිපති දෙපාර්තමේන්තුවට අයත් අධිනීතිඥ කාර්යාල සෑම මහාධිකරණයකම ස්ථාපිත කර ඇති අතර ප්‍රදේශ 14 ක නිල නිවාසද, පිහිටුවා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී යථෝක්ත කාර්යාල සහ නිල නිවාසවල භාණ්ඩ සමීක්ෂණය සිදු කර නොතිබුණි.

## 3.6 දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

**(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

දෙපාර්තමේන්තුවවිසින් පහත සඳහන් ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ යුතු වූ දිනය | ආරම්භ නොකිරීමට හේතු කෙටියෙන් |
|---|---|---|---|
| | රු. | | |
| අධිනීතිඥ නිල නිවාසඉදිකිරිම - කුරුණෑගල | 26,500,000 | 2015.06.15 | මූලික සැලසුම් කටයුතු නිම කිරීමට දුෂ්කර වීම, යුධ හමුදාව මගින් සියළු ඉදිකිරීම් අපේක්ෂා කළද, පසුව එම තත්ත්වය වෙනස්වීම නිසා යුධ හමුදාව මගින් ඉදිකිරීම් කර ගැනීමට නොහැකි වී තිබුණි. |

**(ආ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්**

දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණත් එම ව්‍යාපෘතිය නිම නොකර අතහැර තිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | 2015 දෙසැම්බර් 31 දින වන විට වියදම | අත්හැර දැමීමට හේතු |
|---|---|---|---|---|
| | රු. | | රු. | |
| අධිනීතිඥ නිල නිවාස ඉදිකිරිම-මහනුවර | 26,500,000 | 2015.06.15 | 223,417 | මූලික කටයුතු ආරම්භ කිරීම දෙසැම්බර් මාසය දක්වා ප්‍රමාද වීම සහ ඉදි කිරීමට යුධ හමුදාව යොදවා ගැනීමට නොහැකි වීම. |

(ඇ) **ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිමකළ යුතු දිනය | නිම කළ දිනය | 2015දෙසැම්බර් 31 දින වනවිට වියදම | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|---|
| | රු. මිලියන | | | | රු. | |
| නීතිපති දෙපාර්තමේන්තු වේ නව ගොඩනැගිල්ලඉදි කිරිම | 1,182.00 | 2015.01.01 | 2017.12.31 | නිමකර නැත | 23,489,755 | අමාත්‍ය මණ්ඩල ප්‍රතිපාදන කමිටුව අහෝසි වීම. අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2015/07/29 ලැබිම. |
| අධිනීතිඥ නිල නිවාසඉදිකිරිම-වව්නියාව, මන්නාරම | 53.00 | 2015.06.15 | 2015.12.31 | නිමකර නැත | 19,541,311 | දක්වා නොමැත. |

**3.7 කාර්යසාධනය**

2015 වර්ෂයේ කාර්යසාධන වාර්තාව අනුව දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

| අංශය | වර්ෂය තුළ විවෘත කළ ලිපිගොනු සංඛ්‍යාව | නීතිඥ අංශයට යැවු ලිපිගොනු | වැඩ අවසන් කළ ලිපිගොනු සංඛ්‍යාව | 2015 දෙසැම්බර් 31ට වැඩ අවසන් නොකළ ලිපිගොනු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| සිවිල් අංශය | 2719 | 2192 | 171 | 356* |
| අපරාධ අංශය | 4791 | - | 3473 | 12983 |
| සංස්ථා අංශය | 1681 | - | 1871 | 5365 |
| මහජනපෙත්සම්ඒකකය | 591 | - | 35 | 217* |
| කාන්තා හා ළමා අපචාර නඩු ඒකකය | 3338 | - | 1801 | 17709 |

| | | | | |
|---|---|---|---|---|
| රාජ්‍ය නීතිඥ අංශය | 165 | - | 3315 | ඉදිරිපත් කර නොමැත. |
| ශ්‍රේෂ්ඨාධිකරණ ඒකකය | 508 | - | 532 | ඉදිරිපත් කර නොමැත. |

*2015 වර්ෂයට අදාළ ඉතිරිවීම් පමණි.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සිවිල් අංශයෙන් විවෘත කරන ලිපි ගොනුවලින් බහුතර සංඛ්‍යාවක් නීතිඥ අංශයට යොමුකරන අතර, ලිපිගොනුවල පසු විපරම් කටයුතු සිවිල් අංශයෙන් සිදු කර නොතිබුණි.

(ආ) අපරාධ නඩු හා කාන්තා හා ළමා අපචාර නඩු සම්බන්ධ වැඩ අවසන් නොකළ ලිපිගොනු සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩි වී තිබූ අතර 2015 දෙසැම්බර් 31 වන විට අවසන් නොකළ ලිපිගොනු සංඛ්‍යාව අපරාධ අංශයේ 12,983 ක් සහ කාන්තා හා ළමා අපචාර නඩු ඒකකයේ 17,709 ක් වී තිබුණි.

## 3.8 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 401 | 192 | 209 |
| (ii) | තෘතියික මට්ටම | 12 | 10 | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 193 | 120 | 73 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 255 | 232 | 23 |
| | **එකතුව** | **861** | **554** | **307** |

සහකාර රාජ්‍ය නීති (පරිවාස) නිලධාරීන් 130 කට මාසිකව රු.26,000 ක දීමනාවක් ගෙවීමේ පදනම මත බඳවා ගැනීමට 2014 මාර්තු 12 දිනත්, කණිෂ්ඨ සහකාර රාජ්‍ය නීති තනතුරු 28 ක් බඳවා ගැනීමට 2014 ජුනි 16 දිනත්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබා දී තිබුණි. නමුත් දෙපාර්තමේන්තුව විසින් පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි. තවද, සහකාර රාජ්‍ය නීතිඥ තනතුරු (Assistant State Attorney) 12 ක්ද, ලඝු ලේඛක තනතුරු 27 ක්ද, පුරප්පාඩු පැවතුණි. මෙම පුරප්පාඩු දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය කෙරෙහි බලපා තිබුණි.